විශිෂ්ට පරමාදර්ශී අභිමානවත් පළාත් රාජ්‍ය සේවයක්

පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව - බස්නාහිර පළාත

மாகாண அரசாங்க சேவை ஆணைக்குழு - மேல் மாகாணம்

PROVINCIAL PUBLIC SERVICE COMMISSION - WESTERN PROVINCE

අංක 628,10 වන මහල,ජන ජය සිටි ගොඩනැගිල්ල,නාවල පාර,රාජගිරිය இல.628, 10 வது மாடி, ஜன ஜய சிட்டி வளாகம், நாவல வீதி, ராஜகிரிய No.628,10th Floor, Jana Jaya City Building, Nawala Road, Rajagiriya


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My Ref. | WPC/PSC/REC/04/11-(i) | ඔබේ අංකය<br>உமது இல.<br>Your Ref. | CSWP/PTR/9-3/FI/5 | දිනය<br>திகதி<br>Date | 2025.01. 16 |

ප්‍රධාන ලේකම්,
ප්‍රධාන ලේකම් කාර්යාලය,
බස්නාහිර පළාත.

**<u>බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණයේ සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් (දෙපාර්තමේන්තුමය) තනතුර සඳහා කුසලතා පදනම මත බඳවා ගැනීම - 2025</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබේ සමාංක හා 2024.11.26 දිනැති ලිපිය හා සැබැඳේ.

02. ඉහත තනතුර සඳහා බඳවා ගැනීමේ නිවේදනය හා ආදර්ශ අයදුම්පත්‍රය මේ සමඟ ඉදිරිපත් කරන අතර, එය අපගේ නිල වෙබ් අඩවියේ ද පළ කර ඇති බව කාරුණිකව දන්වා සිටිමි.

03. තවද, නිවේදනයේ සඳහන් උපදෙස් අනුගමනය කරමින් ඉහත තනතුරට අයදුම් කරනු ලබන අයදුම්පත් 2025.02.15 දිනට ප්‍රථම "පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප), අංක 628, 10වන මහල, ජනජය සිටි ගොඩනැගිල්ල, නාවල පාර, රාජගිරිය" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කරන ලෙස අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානින් දැනුවත් කරන මෙන් වැඩිදුරටත් දන්වා සිටිමි.

තිලක් සෙනරත්
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
බස්නාහිර පළාත

දුරකථන : 0112879514
ෆැක්ස් : 0112879512
විද්‍යුත් ලිපින : ppscwprec@slt.lk

පිටපත්:-

01. ලේකම්, පළාත් සමුපකාර සංවර්ධන හා වෙළඳ කටයුතු අමාත්‍යාංශය (බ.ප.) - අ.ක.ස.
02. කොමසාරිස්, සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව (බ.ප) - අ.ක.ස.

## බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණයේ සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් (දෙපාර්තමේන්තුමය) තනතුර සඳහා කුසලතා පදනම මත බඳවා ගැනීම - 2025

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ බස්නාහිර පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණයේ සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් (දෙපාර්තමේන්තුමය) තනතුරෙහි පුරප්පාඩු පිරවීම සඳහා පහත සඳහන් සුදුසුකම් ලත් අභ්‍යන්තර අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**02.** වැටුප් පරිමාණය

මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය රා.ප.ච 03/2016 අනුව රු.47,615-10×1335-8×1630- 17x2170 - 110,895/- වේ. වැටුප් කේත අංකය SL 1-2016 වේ.

**03.** සේවා කොන්දේසි

i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදි ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට ඔබ යටත් විය යුතුය.

ii) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයටද, බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ කාර්ය පටිපාටික රීති සංග්‍රහයටද, රජයේ හා බස්නාහිර පළාත් සභාවේ මුදල් රෙගුලාසි වලටද, රජයේ හා බස්නාහිර පළාත් සභාවේ වෙනත් රෙගුලාසි වලටද, චක්‍රලේඛ හා උපදෙස් වලටද, ඒවාට අදාළ වරින් වර නිකුත් කරනු ලබන සංශෝධන වලටද ඔබ යටත් විය යුතු වේ.

**04.** පවත්නා පුරප්පාඩු ක්ෂේත්‍රයන්

සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් (දෙපාර්තමේන්තුමය) තනතුරෙහි පුරප්පාඩු 01 ක් පවතී. මෙම තනතුරෙහි පුරප්පාඩු සඳහා බඳවා ගැනීම සම්බන්ධයෙන් අවසාන තීරණය බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

**4.1** අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනය **2025.02.15** දින වේ.

**05.** සුදුසුකම්

**5.1.** අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්

බස්නාහිර පළාත් සමුපකාර සංවර්ධන දිස්ත්‍රික් නිලධාරියෙකු වශයෙන් වසර 01ක පළපුරුද්දක් ලබා තිබීම.

**5.2.** පළපුරුද්ද

I. උසස්වීමේ දිනට පූර්වාසන්නතම වසර 05 තුල සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම. (පාලන චක්‍රලේඛ අංක 04/2021 හි සඳහන් විධිවිධානයන්ට ප්‍රකාරව)

II. සමුපකාර සංවර්ධන නිලධාරියෙකු/ සමුපකාර සමිති පරීක්ෂකවරයෙකු ලෙස සංවර්ධන/ විගණන/ තීරක හා විමර්ශන අංශ තුනෙහිම සතුටුදායක සේවා පළපුරුද්දක් තිබීම. (පත්වීම් ලිපි, කාර්ය ප්‍රගතිය, සේවා ඇගයීම් හා වාර්ෂික කාර්ය සාධන වාර්තා මගින් සනාථ කළ යුතු වේ)

**5.3.** කායික සුදුසුකම්

සෑම අපේක්ෂකයෙකුම බස්නාහිර පළාත තුල ඕනෑම දිස්ත්‍රික්කයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

**5.4.** වෙනත්

පහත සඳහන් පරිදි වෙනත් සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුය:

i. අයදුම්කරු ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.

ii. යහපත් චරිතයකින් යුක්ත වීම.

iii. මෙම තනතුරට බඳවා ගැනීමට අදාළ නිවේදනයේ සඳහන් සියළුම සුදුසුකම් **2025.02.15** දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

iv. වයස් සීමාව අදාල නොවේ.

**06.** **බඳවා ගැනීමේ ක්‍රමය:**

**6.1.** **සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය**

ඉටු කර ගැනීමට අපේක්ෂිත අරමුණු : සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේදී කරනු ලබන සුදුසුකම් පරීක්ෂාව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදීම සිදු කරනු ඇත.

**6.2.** **ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය - මණ්ඩලය කොමිෂන් සභාව විසින් පත් කරනු ලැබේ.**

| ලකුණු ලබාදෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| අමතර අධ්‍යාපන සුදුසුකම් | 20 | ලකුණු ලබා ගැනීමේ කුසලතා අනුපිළිවෙල අනුව උපරිම ලකුණු ලබා ගන්නා අයගෙන් පුරප්පාඩු පුරවනු ලැබේ. |
| වෘත්තීය අධ්‍යාපන සුදුසුකම් | 15 | |
| පළපුරුද්ද හා සේවා නිපුණත්වය (දිස්ත්‍රික් නිලධාරි සේවා කාලය හා ඒ ඒ අංශවල සේවය කර ඇති කාලයට නිපුණතාවය) | 60 | |
| පෞරුෂත්වය | 05 | |
| **එකතුව** | 100 | |

**6.2.1** **ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ලකුණු ලබාදෙන ක්ෂේත්‍ර සහ ලකුණු ප්‍රමාණයන්**

| ලකුණු ලබා දෙන ප්‍රධාන ක්ෂේත්‍ර | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| A. <u>අමතර අධ්‍යාපන සුදුසුකම්</u><br>රජය පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් උපාධියක් සඳහා<br>- ලකුණු -10<br>රජය පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් සඳහා<br>- ලකුණු -15<br>රජය පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් පශ්චාත් උපාධියක් සඳහා<br>- ලකුණු -20<br>***සංලක්ෂය 1 - ඉහළම අධ්‍යාපන සුදුසුකම් සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.** | **20** | අදාළ නොවේ |

| | | |
|---|---|---|
| **B.** <u>වෘත්තීය අධ්‍යාපන සුදුසුකම්</u><br>රජය පිළිගත් ආයතනයක් විසින් පවත්වනු ලබන කළමනාකරණ ක්ෂේත්‍රයට හෝ සමුපකාර ක්ෂේත්‍රයට අදාළ,<br>• මාස 06 කට නොඅඩු පාඨමාලාවක් සඳහා ලකුණු -10<br>• එක් අවුරුද්දකට වැඩි පාඨමාලාවක් සඳහා ලකුණු -15<br><br>*** සංලක්ෂය 2 - එක් පාඨමාලාවක් සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.** | **15** | |
| **C.** <u>පළපුරුද්ද සහ සේවා නිපුණතාවය</u><br>i) සුදුසුකම් සලකා බලන විට සමුපකාර සංවර්ධන නිලධාරි හා සමුපකාර සමිති පරීක්ෂක තනතුරේ I පන්තියේ සේවා කාලය එක් වසරක් සඳහා ලකුණු 03ක් හිමිවේ. - උපරිම ලකුණු 15<br>ii) දිස්ත්‍රික් නිලධාරි තනතුරේ සේවා කාලය එක් වසරක් සඳහා ලකුණු 03ක් බැගින් උපරිම ලකුණු 30<br>iii) බස්නාහිර පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ සංවර්ධන, විගණන, තීරක හෝ විමර්ශන යන අංශවල සේවය කිරීමේ පළපුරුද්ද එක් වසරක් සඳහා ලකුණු 03 බැගින් උපරිම ලකුණු 15<br>*** සංලක්ෂය 3 - පාලන චක්‍රලේඛ අංක: 01/2022 ප්‍රකාරව ජ්‍යෙෂ්ඨතාවය ගණනය කරනු ලැබේ.** | **60** | |
| **D.** <u>පෞරුෂත්වය</u> ලකුණු 05 | **05** | |

**07. අයදුම් කිරීමේ ක්‍රමය:**

(අ) අයදුම්පත්‍රය මෙම නිවේදනයට යා කොට ඇති ආදර්ශ ආකෘතියට අනුකූලව කඩදාසියේ දෙපසම භාවිතා කරමින් A4 ප්‍රමාණයේ කඩදාසිවල පිළියෙළ කර අපේක්ෂකයා තම අත් අකුරින්ම පැහැදිලිව පිරවිය යුතුය

(ආ) සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය **2025.02.15** වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ "ලේකම්, බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, අංක 628, 10 වන මහල, ජන ජය සිටි ගොඩනැගිල්ල, නාවල පාර, රාජගිරිය" වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත්‍ර බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ **"බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ බස්නාහිර පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණයේ සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් (දෙපාර්තමේන්තුමය) තනතුර සඳහා කුසලතා පදනම මත බඳවා ගැනීම - 2025"** යන්න පැහැදිලි ලෙස සඳහන් කර තම ආයතන ප්‍රධානියා, දෙපාර්තමේන්තු ප්‍රධානියා, අමාත්‍යාංශ ලේකම් මගින් ඔවුන්ගේ නිර්දේශ සහිතව එවිය යුතුය. නියමිත දිනට පසුව ලැබෙන කිසිදු අයදුම්පතක් භාරගනු නොලැබේ.

**08.** අයදුම්පත් කැඳවීමේ නිවේදනයට අදාළ කරුණු හෝ එම නිවේදනයෙන් ආවරණය නොවන වෙනත් කරුණු සම්බන්ධයෙන් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසන් තීරණය වේ.

**09.** මෙම දැන්වීම හා ආදර්ශ අයදුම්පත්‍රය බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ <u>www.psc.wp.gov.lk</u> නිල වෙබ් අඩවියේද පළ කර ඇත.

තිලක් සෙනරත්,
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
බස්නාහිර පළාත.
**2025.01.16**

තිලක් සෙනරත්
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
බස්නාහිර පළාත

## ආදර්ශ අයදුම්පත්‍රය

## බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ බස්නාහිර පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණයේ සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් (දෙපාර්තමේන්තුමය) තනතුර සඳහා කුසලතා පදනම මත බඳවා ගැනීම - 2025

1. නම (මුලකුරු සමඟ) : ..........................................................................................

2. මුලකුරු වලින් හැඳින්වෙන නම් : ..........................................................................................

..........................................................................................

3. ජාතික හැඳුනුම්පත් අංකය :

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

4. ස්ත්‍රී/පුරුෂ භාවය (අදාළ කොටුව තුළ "√" ලකුණ යොදන්න)

ස්ත්‍රී ☐ පුරුෂ ☐

5. විවාහක/අවිවාහක බව (අදාළ කොටුව තුළ "√" ලකුණ යොදන්න)

විවාහක ☐ අවිවාහක ☐

6. උපන්දිනය වර්ෂය: ☐☐☐☐ මාසය: ☐☐ දිනය: ☐☐

7. දුරකථන අංකය

කාර්යාලීය : ☐☐☐☐☐☐☐☐☐☐ ජංගම : ☐☐☐☐☐☐☐☐☐☐

(* බඳවා ගැනීම සම්බන්ධ සියළු තොරතුරු ඉහත සඳහන් කරනු ලබන ජංගම දුරකථන අංකයට SMS මඟින් දැනුම් දීම කරනු ලබන බැවින් වලංගු දුරකථන අංකයක් සඳහන් කරන්න. පසුව SMS නොලැබීම සම්බන්ධව කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.)

8. දැනට සේවය කරන දෙපාර්තමේන්තුව, සේවා ස්ථානය හා එහි ලිපිනය : ..........................................................................................

..........................................................................................

9. සේවය ස්ථිර කරන ලද දිනය : ..........................................................................................

10. 10.1 මුල් පත්වීමේ දිනය : ..........................................................................................

    10.2 මුල් තනතුර : ..........................................................................................

11. බස්නාහිර පළාත් සමුපකාර සංවර්ධන දිස්ත්‍රික් නිලධාරි තනතුරට පත් වූ දිනය හා දිස්ත්‍රික් නිලධාරි තනතුරේ සේවා කාලය :

..........................................................................................

12. ඔබ විසින් සමුපකාර සංවර්ධන දිස්ත්‍රික් නිලධාරී තනතුරට අදාළව සමත් විය යුතුව තිබූ කාර්යක්ෂමතා කඩඉම් නියමිත දිනට සමත් වී තිබේද? ..........................................................................................

13. 13.1 නිවේදනයේ 5.1 හි සුදුසුකම සම්පූර්ණවන දිනට පූර්වාසන්න වසර 05 තුළ අදාළ තනතුරෙහි සියළු වැටුප් වර්ධක උපයාගෙන තිබේද? ..........................................................................................

    13.2 වැටුප් වර්ධක උපයාගෙන නොමැතිනම් ඒ පිළිබඳ විස්තර දක්වන්න ..........................................................................................

..........................................................................................

14. 14.1 ඔබ සමුපකාර සංවර්ධන දිස්ත්‍රික් නිලධාරී තනතුරට පත්වීමෙන් පසු වැටුප් රහිත නිවාඩු/වැටුප් රහිත විදේශ නිවාඩු ලබා තිබේද? ..........................................................................................

    14.2 ලබා තිබේ නම් එම කාල සීමාවන් සඳහන් කරන්න ..........................................................................................

**15.** 15.1 නිවේදනයේ 5.1 සුදුසුකම සම්පූර්ණවන දිනට පූර්වාසන්න වසර 05 තුළ ඔබට විරුද්ධව විනයානුකූලව කටයුතු කර තිබේද? එසේ කිරීමට අදහස් කර තිබේද? ..........................................................................................

15.2 විනයානුකූලව දඬුවම් කර තිබේනම් ඒ පිළිබඳ විස්තර දක්වන්න ..............................................................

..........................................................................................................................................................................

මා විසින් ඉහතින් සඳහන් කර ඇති සියළුම තොරතුරු සත්‍ය හා නිවැරදි බවත් එම තොරතුරු සාවද්‍ය යැයි තහවුරු වුවහොත් බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ බස්නාහිර පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණයේ සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් (දෙපාර්තමේන්තුමය) තනතුරට පත් කිරීම සඳහා වූ මාගේ හිමිකම නොසලකා හරිනු ලැබීමටද, මට විරුද්ධව විනයානුකූල කටයුතු කරනු ලැබීමටද හැකි බව මම හොඳාකාරවම දනිමි.

.......................                                                                                .....................................

දිනය                                                                                                නිලධාරියාගේ අත්සන

**16.** <u>ආයතන ප්‍රධානියාගේ සහතිකය</u>
(අනවශ්‍ය වචන කපා හරින්න)

**16.1** මෙම ආයතනයේ සේවයේ නියුතු ................................................................. මහතා/මහත්මියගේ පෞද්ගලික ලිපිගොනුව අනුව මෙම නිලධාරිණිය කාර්යක්ෂමව හා අනලස්ව රාජකාරිය ඉටු කරන/නොකරන බවත්,

**16.2** මෙම නිලධාරියා/නිලධාරිණිය විසින් සමුපකාර සංවර්ධන නිලධාරී තනතුරට/ සමුපකාර සංවර්ධන දිස්ත්‍රික් නිලධාරී තනතුරට අදාළව සමත් විය යුතුව තිබූ කාර්යක්ෂමතා කඩඉම් නියමිත දිනට සමත් වී ඇති/නැති බවත්,

**16.3** මෙම නිලධාරියා/නිලධාරිණිය නිවේදනයේ 5.1 සුදුසුකම සම්පූර්ණවන දිනට වසර 05 ක් තුළ උපයාගත යුතුව තිබූ සියළු වැටුප් වර්ධක උපයාගෙන ඇති/නැති බවත්,

**16.4** මෙම නිලධාරියා/නිලධාරිණිය නිවේදනයේ 5.1 සුදුසුකම සම්පූර්ණවන දිනට වසර 05 ක් තුළ දඬුවම් ලැබිය යුතු වරදක් සිදු කර ඇති/නැති බවත්,

**16.5** මෙම නිලධාරියා/නිලධාරිණිය නිවේදනයේ 5.1 සුදුසුකම සම්පූර්ණවන දිනට වසර 05 ක් තුළ විනය විරෝධී කටයුත්තක් සම්බන්ධයෙන් විනයානුකූල කටයුතු සිදු කළ බවත්/නොකළ බවත්/එසේ සිදු කිරීමට අදහස් කරන බවත්/නොකරන බවත්,

**16.6** මෙම නිලධාරියා/නිලධාරිණියට නිවේදනයේ 5.1 සුදුසුකම සම්පූර්ණවන දිනට වසර 05ක සක්‍රිය සේවා කාලයක් ඇති/නැති බවත්,

**16.7** මෙම නිලධාරියා/නිලධාරිණියට සමුපකාර සංවර්ධන දිස්ත්‍රික් නිලධාරී තනතුරේ වසර 01ක සක්‍රිය සේවා කාලයක් ඇති/නැති බවත්,

සටහන - වැටුප් රහිත නිවාඩු/ වැටුප් රහිත විදේශ නිවාඩු ලබා තිබේ නම්, වැටුප් වර්ධක උපයාගෙන නොමැති නම්, විනය විරෝධී කටයුත්තක් සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කර ඇත්නම් හෝ විනයානුකූලව කටයුතු කිරීමට හෝ අදහස් කරන්නේ නම්, ඒ පිළිබඳ විස්තර දක්වන්න. (පාලන චක්‍රලේඛ අංක: 4/2021 හි සඳහන් විධිවිධාන ප්‍රකාරව)

..........................................................................................................................................................................

..........................................................................................................................................................................

මෙම නිලධාරියා/ නිලධාරිණිය බස්නාහිර පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණයේ සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් (දෙපාර්තමේන්තුමය) තනතුර සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය අනුව සියළුම සුදුසුකම් සපුරා ඇති/ නැති බව නිර්දේශ කරමි.

.....................................                                    ...................................................

දිනය                                                            ආයතන ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව

**17.** <u>දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය</u>

ඉහත නිර්දේශය හා එකඟ වෙමි/නොවෙමි.

....................................                ..........................................................

දිනය                දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව

**18.** <u>අමාත්‍යාංශ ලේකම් (බ.ප) ගේ නිර්දේශය</u>

ඉහත නිර්දේශය හා එකඟ වෙමි/නොවෙමි.

.................................                ............................................................

දිනය                අමාත්‍යාංශ ලේකම් (බ.ප) ගේ අත්සන හා නිල මුද්‍රාව